# සුරංගනා ලොවක අරුමය



වයි.එල්.ඒ.තුර්ණී ගඟනයා යකන්දාවල

# වයි.එල්.ඒ.තූර්ණි ගඟනයා යකන්දාවල
(කතෘ)

## පළමු දිගහැරීම වේ.

| | | |
|---|---|---|
| පාසල | :- | මහාමායා බාලිකා විදුහල මහනුවර |
| ඉගෙනුම ලබන පන්තිය | :- | 6 ශ්‍රේණිය **A** |
| කෘතිය පල කරන දිනය | :- | 2026 |
| **ISBN** | :- | 978-624-211-431-6 |

# පිදුම

**මාගේ ආදරණීය මහාමායා**
**මෑණියන්ට**
**'සුරංගනා ලොවක අරුමය'**
**නම් වූ**
**මෙම පොත**
**ඉතා ආදරයෙන් පිළිගන්වමි.**



# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරනු හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ග්‍රන්ථකරුවන් ලෙස දෑයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සියලු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි. මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිනිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා ගැනීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ.
ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාළිගාව
2026.05.10

# ස්තූතිය

මට මේ පොත ලස්සනට ලියන්න
මාත් එක්ක අදහස් හා වචන වලින්ද
උදව් උපකාර කළ
මාගේ අම්මා, අප්පච්චි
ඇතුළු සියලු දෙනාටම
මම ගොඩක් ස්තූති
වන්ත වෙමි.


කතෘ :- වයි.එල්.ඒ. තූර්ණි ගඟනායා යකන්දාවල

ලිපිනය :- නොඃ 52/1, ඉහලවත්ත, වැලිගම්පල, නාවලපිටිය

දුරකථන අංකය :- 077 2734960




එකමත් එක කාලෙක ලස්සන දිය ඇල්ලක් අසල පාට පාට මල් වලින් සුවඳවත් වු, පලතුරු ගස් වලින් පිරුණු වනාන්තරයක් තිබුණා. ඒ වනාන්තරයේ ජීවත් වුණා. පාට පාට ඇඳුමින් සැරසුණු ලස්සනම ලස්සන සුරංගනාවියෝ කිහිප දෙනෙක්.





මේ සුරංගනාවියන්ට එක එක ආකාරයේ බලයන් තිබුණා. සුරංගනාවියන් අතර ගින්දර බලයක් ඇති මැටෙල්ඩා සුරංගනාවියත්, ජලය හා හිම බලයක් හිමි සුරංගනාවිය වන ස්කාලට් යන සුරංගනාවියන් දෙදෙනා අනෙක් සුරංගනාවියන් අතරින් ඉතා කැපී පෙනෙන චරිත දෙකක් වුණා.

සුරංගනා ලෝකයේ රැජිණ ලෙස තේරුණේ ලීසා නම් සුරංගනාවියයි. ලීසාට අනෙක් සුරංගනාවියන්ට ඇති සියළු බලයන් පිහිටා තිබුණු නිසයි ඇයට සුරංගනා ලෝකයේ රැජිණ වීමට පුළුවන් වුණේ.





සෑම අවුරුද්දක් අවසානයේ ම මේ සුරංගනාවියන් අතර රූපලාවන්‍ය තරඟයක් පවත්වනවා. මෙම තරඟයට සියලුම සුරංගනාවියන්ට සහභාගී වීමට පුළුවන්. සුරංගනාවියන් අතරින් වඩාත් ම කැපී පෙනෙන මැටෙල්ඩා සහ ස්කාලට් ද මෙම තරඟයට සහභාගී වුණා. මේ අය අතරින් ඉතා අලංකාරව හා අන් අය අතරින් වඩාත්ම කැපී පෙනෙන සුරංගනාවිය තමයි මෙම තරගයෙන් ජයග්‍රහණය කරන්නේ.

රූපලාවන්‍ය තරඟය පැවැත්වෙන දවස උදා වුණා. සුරංගනාවියන් විවිධ වූ විලාසිතාවන්ගෙන් සැරසී තරඟයට සහභාගී වුණා. එදින මුළු සුරංගනා ලෝකෙම හරිම ලස්සනට සරසලා තිබුණා. සුරංගනාවියන් හරිම ලස්සනට සැරසිලා හිටියා. පැමිණි සිටි සියළු දෙනාගේම කැමැත්ත පරිදි රූපලාවන්‍ය තරඟයෙන් ජයග්‍රහණය හිමි වුයේ ජලය හා හිම බලයක් ඇති ස්කාලට් සුරංගනාවියටයි. මැටෙල්ඩාට හිමි වුයේ දෙවන ස්ථානයයි. ලීසා රැජිණ ස්කාලට් සුරංගනාවියන්ගේ ජයග්‍රහණය වෙනුවෙන් ඇයට ඔටුනු පළඳා අනෙක් සුරංගනාවියන්ගේ ප්‍රීති ඝෝෂා මැද උත්සවය අවසන් කළා. ලීසා ස්කාලට්ගේ ජයග්‍රහණය දැක ඉතා සතුටට හා ආඩම්බරයට පත්වුණා.





නමුත් මැටෙල්ඩා ස්කාලට්ගේ ජයග්‍රහණය දැක ඇයට ඊර්ෂ්‍යා කරන්න පටන් ගත්තා. මැටෙල්ඩා සිතුවේම ස්කාලට්ට කෙසේ හෝ අනතුරක් සිදුකළ යුතු බවයි. ඒ සඳහා ඇය උපක්‍රමයක් කල්පනා කරමිනුයි සිටියේ. ඇගේ උපක්‍රමය සාර්ථක කර ගැනීමට ඇය නාග ලෝකයට ගොස් නාග රජු මුණ ගැසී, සුරංගනා ලෝකයට ඇතුළු වී සුරංගනා ලෝකය විනාශ කර ස්කාලට් සුරංගනාවිය පැහැර ගන්නා ලෙස පැවසුවා.

නාග ලෝකයේ සිටි නාගයින් මැටෙල්ඩාගේ කතාව අසා සුරංගනා ලෝකයට ගොස් එය විනාශ කිරීමට පටන් ගත්තා. සුරංගනා ලෝකයේ තිබුණ පාට පාට සුවඳින් පිරුණු මල්, පලතුරු ගස් වලින් පිරුණු වනාන්තරය, මේ හැම දෙයක්ම නාගයින් විනාශ කළා.





ඉන්පසු නාගරජු ස්කාලට් සොයා ගෙන ගියා. ස්කාලට් ඇගේ උපරිම බලය යොදා නාගරජු සමඟ සටන් කළා. නමුත් ස්කාලට්ගේ බලය, නාගරජුගේ බලයට සමකළ නොහැකි විය. නාගරජු ස්කාලට්ව රැගෙන අනිත් නාගයින් සමඟ නාග ලෝකයට ගියා.

ලීසා රැජිණ සුරංගනාවන් සියළුම දෙනා කැඳ වු අතර, එහි දී ස්කාලට් නැති බව රැජිනට තේරුණා. ඇයට හිමිව තිබු බලයන් නිසාවෙන් රැජිණ සිතූ පරිදිම ස්කාලට්ව නාග රජු විසින් පැහැර ගෙන ගිය බව තේරුණා. රැජිණ අනෙක් සුරංගනාවියන් සමඟ නාග ලෝකයට ගමන් කළා. නමුත් මැටෙල්ඩා මේ ගමන යන්න කැමති වුයේ නැහැ. රැජිණ අනෙක් කුමාරියන් සමඟ නාග ලෝකයට ඇතුළු වුණා.





ස්කාලට්ව සිරකරන් සිටිනවා. දුටු රැජිණ ඇතුළු අනෙක් සුරංගනාවියන් සියලුම දෙනා ඉතාමත් කණගාටුවට පත් වුණා. රැජිණ කෙසේ හෝ ඇගේ බලයන් යොදා ගෙන නාගරජු සමඟ සටන් කර ස්කාලට්ව බේරා ගත්තා.

රැපිණ, නාගරජුගෙන් විමසුයේ ස්කාලට්ව කුමන හේතුවක් නිසා පැහැර ගත්තා ද යන්නයි. නාගරජු පැවසුයේ මැටෙල්ඩාගේ වුවමනාවට මෙය සිදු කළ බවයි. නැවතත් රැපිණ, ස්කාලට් ඇතුළු සියළුම සුරංගනාවියන් නාග ලොවෙන් නික්ම වී සුරංගනා ලෝකයට පැමිණියා.





රැජිණ, මැටෙල්ඩාව කැඳවා මෙය සිදු කිරීමට හේතුව විමසුවා. ස්කාලට් රූපලාවන්‍ය තරඟයෙන් ජයග්‍රහණය කළ නිසා තමාගේ සිතේ ඇය පිළිබඳව හටගත් ඊර්ෂ්‍යාව හේතුවෙන් ස්කාලට් කුමාරියව පැහැර ගන්නා ලෙසට නාගරජුට පැවසුවා යැයි කිව්වා. රැජිණ මැටෙල්ඩාට, ජය පරාජය යනු කුමක් ද, ජය පරාජය සමසේ විඳ ගන්නේ කෙසේ ද, අනුන්ට ඊර්ෂ්‍යා කිරීමෙන් තමන්ට ලැබෙන අයහපත් දේ මොනවාද යන්න ඉතා කරුණාවෙන් පැහැදිලි කර දුන්නා.

මැටෙල්ඩා විසින් සිදු කළ වරද පිළිබඳව ඇය කණගාටුවට පත් වුණා. ඇය විසින් සිදු වූ වරදට ස්කාලට්ගෙන් සමාව ඉල්ලා සිටියා. මැටෙල්ඩා නැවතත් පෙර පරිදිම අන් සුරංගනාවියන් සමඟ සමගියෙන් කල් ගත කළා.





ඉන්පසු සියලුම දෙනා නාගයින් විසින් විනාශ කරන ලද සුරංගනා ලෝකය නැවතත් පෙර තිබූ ලෙසම ඉතා ලස්සන සුරංගනා ලෝකයක් බවට පත් කළා. ලීසා රැපිණ, මැටෙල්ඩා, ස්කාලට් ඇතුළු සියලුම සුරංගනාවියන් සියලු දෙනාම හැමදාම සතුටින්, සමඟියෙන් ජීවත් වුණා.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කරුවන් දෑයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් , ලබාදිය නොහැකි නිසාය.

මෙන්න ඔබ ලබා දුන් දෙවන රූපයේ ඇති සිංහල පෙළෙහි සම්පූර්ණ පිටපත (Transcription)፡ තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතිය උදෙසා සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි. මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහාලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN No:-** 978-624-211-431-6